# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,164- 2020 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**2020 අධ්‍යයන වර්ෂය සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම**

01. 2020 අධ්‍යයන වර්ෂය තුළ දී පැවැත්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම පාඨමාලාව කොළඹ, පේරාදෙණිය, රජරට සහ යාපනය යන විශ්වවිද්‍යාලවල පැවැත් වේ.

03. එක් එක් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යයන් පහත දක්වා ඇති අතර පාඨමාලාව සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් අයදුම් කළ හැකි ය.
   1. කොළඹ විශ්වවිද්‍යාලය - සිංහල සහ දෙමළ මාධ්‍යය
   2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය - සිංහල මාධ්‍යය
   3. රජරට විශ්වවිද්‍යාලය - සිංහල මාධ්‍ය
   4. යාපනය විශ්වවිද්‍යාලය - දෙමළ මාධ්‍යය

04 සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇය පහත සඳහන් සුදුසුකම් ඇත්තෙකු බව තහවුරු කළ යුතු ය :-

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකු වීම,

(ii) 2020.03.20 දිනට වයස අවුරුදු 50ට නොවැඩි වීම,

(iii) මනා කායික හා මානසික සෞඛ්‍යයකින් සහ යහපත් චරිතයකින් යුක්ත වීම,

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත වෙනත් ආයතනයකින් උපාධියක් හෝ ඒ හා සමාන මට්ටමේහිලා සැළකෙන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

(v) පහත දැක්වෙන සේවාවලට අදාළ තනතුරක ස්ථිර පත්වීමක් ලැබ සේවය කිරීම.

(අ) *ශ්‍රී ලංකා ගුරු සේවය
*ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවය
*ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවය

(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය
(ඇ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය
(ඉ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

(vi) 2020.03.20 වැනි දිනට එකී අංක 04 (v) හි දක්වා ඇති සේවාවකට අයත් තනතුරක උපාධිධාරියකු ලෙස අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සැලකිය යුතු යි* :-

(i) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පත්වීම් ලබා ඇති ගුරුවරුන් 2020.03.20 වැනි දිනට තම පත්වීමට අදාළ බැඳුම්කරයේ කාලසීමාව වන අනිවාර්යය පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ වී තිබේනම් හා 4 (iv) හි සඳහන් සුදුසුකම් සපුරා තිබේනම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(ii) අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කරයකට යටත්ව සිටින අයදුම්කරුවන් 2020.03.20 වැනි දිනට බැඳුම්කරයේ සඳහන් අනිවාර්යය සේවා කාලය අවසන් කළ හෝ එසේ නොමැති නම් ඉන් අවුරුදු පහක්වත් (05) සම්පූර්ණ කර තිබේනම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

(iii) අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ නොහැකි ය.

05.

05. 1 *තෝරා ගැනීමේ පිළිවෙල* :

(i) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

(ii) පාඨමාලාව සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණු අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(iii) *ගැසට්* නිවේදනයේ අංක 04 (V) හි අයදුම්කරු අයත් වන සේවාවට/සේවාවලට අදාළ තනතුරෙහි/තනතුරුවල සේවා කාලය සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනැමීම සිදු කෙරෙනු ඇත. සේවා කාලයේ එක් අවුරුද්දකට ලකුණු 04 බැගින් පිරිනැමේ. සේවා කාලය සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 40 කි. අයදුම්කරුවකුගේ සේවා කාලය ගණනය කරන්නේ ඔහු/ඇය 4(v) හි දැක්වෙන සේවාවන් අතුරින් මුලින් ම පත්වීම ලද සේවයේ අදාළ තනතුරෙහි වැඩභාර ගත් දින සිට ය.

*සැලකිය යුතු යි* :

**4(V) හි සඳහන් සේවාවක/සේවාවල, තනතුරක/ තනතුරුවල අඛණ්ඩ සේවා කාලයක් පැවතිය යුතු ය.**

(iv) ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා සේවා කාලය සඳහා ලැබෙන ලකුණුවල එකතුව අවසාන ලකුණ සේ සලකා එම ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත.

(v) දුබලතා සහිත අයදුම්කරුවන් අයදුම් කළහොත් පාඨමාලාවට තෝරාගනු ලබන සංඛ්‍යාවෙන් 1%ක් ඔවුන් සඳහා වෙන් කරනු ලැබේ.

(vi) පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලබන සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලයේ තිබෙන ඉඩකඩ ප්‍රමාණය අනුව තීරණය වනු ඇත.

05.2 ලිඛිත පරීක්ෂණය :

(i) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන් කොළඹ හා යාපනය යන නගරවල දී පැවැත්වේ.

(ii) ඉහත සඳහන් මධ්‍යස්ථාන දෙක අතරින් තමා ඉල්ලුම් කළ මධ්‍යස්ථානයේ දී ඉල්ලුම් කළ මාධ්‍යයෙන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැකි ය. අයදුම්කරන ලද විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කරනු නොලැබේ.

(iii) විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම පිළිබඳව ප්‍රකාශ කොට ඇති නීතිරීතිවලට අනුකූලව විභාග අපේක්ෂකයන් විසින් කටයුතු කළ යුතු ය.

(iv) ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත ය.

(අ) සාමාන්‍ය දැනීම :
කාලීන තොරතුරු, සාමාන්‍ය දැනීම, අධ්‍යාපනික තොරතුරු හා ගැටලු පිළිබඳ ප්‍රශ්න පත්‍රය
(කාලය පැය 01)

(ආ) අභියෝග්‍යතාවය :
භාෂා හැකියාව, අවබෝධය, තර්කනය හා සංඛ්‍යානමය කුසලතා පිළිබඳ ප්‍රශ්න පත්‍රය
(කාලය පැය 01 යි, මිනිත්තු 30 යි)

05.3 සම්මුඛ පරීක්ෂණය :

(i) සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින් විසින් *ගැසට්* නිවේදනයේ 04 වැනි ඡේදය අනුව තමන් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බව තහවුරු කළ යුතු ය.

(ii) අපේක්ෂකයින් විසින් *ගැසට්* නිවේදනයේ අංක 04 (V) හි සේවාවක/සේවාවල, අදාළ තනතුරෙහි/තනතුරුවල සේවා කාලය තහවුරු කිරීමට නියමිත ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය. විශේෂයෙන්ම මුල් පත්වීමට අදාළ තනතුරෙහි වැඩ භාරගත් දිනය සම්මුඛ පරීක්ෂණයේ දී තහවුරු කළ යුතු ය. එය අපේක්ෂකයාට සේවා කාලය සඳහා නියමිත ලකුණ ලබා ගැනීමට උපකාර වනු ඇත.

(iii) රජයේ ලියාපදිංචි පිරිවෙන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ගුරුභවතුන්,
(අ) පාඨමාලාව සඳහා නිදහස් කරන බවටත්,
(ආ) පාඨමාලාව හදාරන කාලය තුළ වැටුප් ගෙවන බවටත්,
(ඇ) පාඨමාලාව අවසානයේ ගුරුභවතා නැවත සේවයට යොදා ගන්නා බවටත්,
(ඈ) අදාළ ගුරුභවතාගේ අධ්‍යයන කාලය තුළ ඔහු/ඇයගේ පුරප්පාඩුවට වෙනත් ගුරුවරයෙකු බඳවා නොගන්නා බවටත්,
(ඉ) ගුරුභවතාගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවටත්, ආයතනයේ කෘත්‍යාධිකාරී/පාලක මණ්ඩල කළමණාකරු විසින් සහතික කරන ලද ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

*සැලකිය යුතුයි.*-යම් හෙයකින් පාඨමාලාව සඳහා බඳවා ගත හැකි සංඛ්‍යාවට වඩා ඉල්ලුම්පත් ඉදිරිපත්කර ඇති සංඛ්‍යාව අඩුනම්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාවය මත ලිඛිත පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව සම්මුඛ පරීක්ෂණයෙන් පමණක් අයදුම්කරුවන් තෝරා ගනු ඇත.

06. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

(i) දී ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කළ යුතු ය.

(ii) දෘශ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල වම්පස උඩ කෙළවරේ රතු පාටින් "දෘෂ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iii) විභාග ගාස්තු ගෙවීම :
විභාග ගාස්තු වශයෙන් රු. 900.00 ක මුදලක් ළඟම ඇති තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් කුවිතාන්සිය අයදුම්පතෙහි ඒ සඳහා ඇති කොටුවෙහි ඇලවිය යුතු ය.

2020.02.20 දින සිට 2020.03.20 දින දක්වා සියලු ම තැපැල් කාර්යාලයන්හි මෙම කුවිතාන්සිය නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් තැපැල්පති වෙත දන්වා යවනු ඇත.

(iv) අයදුම්පත් එවීම :

(අ) අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව - 2020" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ආ) 2020.03.20 දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු වේ.

(ඇ) ඉදිරිපත් කරන අයදුම්පතෙහි පිටපතක් අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට ආයතන ප්‍රධානියා මගින් භාරදිය යුතු වේ. එය පාඨමාලාව සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහුට/ඇයට අධ්‍යයන නිවාඩු ලබාගැනීමේ දී උපකාරී වනු ඇත.

(v) කාලසටහන් හා ප්‍රවේශපත්‍ර විභාග අපේක්ෂකයින් වෙත තැපැල් මගින් නිකුත් කරන අතර තම ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 07 කට පෙර නොලැබුනහොත් "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට පහත සඳහන් තොරතුරු සහිතව දැන්විය යුතු වේ.

(අ) විභාගයේ නම :————.
(ආ) විභාග අපේක්ෂකයාගේ සම්පූර්ණ නම:———.
(ඇ) ලිපිනය :————.
(ඈ) මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :————.


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 මාර්තු මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

(ඉ) ඉල්ලුම්පත තැපැල් කළ දිනය :————.
(ඊ) ඉල්ලුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :————.

(vi) කිසිදු හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු භාරදීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම කරනු නොලැබේ.

(vii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව, වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් මගින් තහවුරු කළ යුතු ය.

(ix) අදාළ පාඨමාලාව හැදෑරීමට අයදුම්කරුවකු යම් විශ්වවිද්‍යාලයකට තෝරා ගැනීමෙන් පසු විශ්වවිද්‍යාලය මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

(x) තෝරා ගැනීමෙන් පසුව වුව ද *ගැසට්* නිවේදනයට අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව පෙනී යන්නේ නම් එවැනි අපේක්ෂකයකුගේ තෝරා ගැනීම අවලංගු කිරීමට සිදු වේ.

07. ***අධ්‍යයන නිවාඩු :***
තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සහ ජාතික පාසල්, පෞද්ගලික පාසල් සහ පිරිවෙන්වල සේවයේ නියුක්ත විදුහල්පති ශ්‍රේණිධාරීන් සහ ගුරුවරුන් අධ්‍යයන නිවාඩු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ද සෙසු අයදුම්කරුවන් අධ්‍යයන නිවාඩු අදාළ පළාතේ අධ්‍යාපන ලේකම් වෙතින් ද අනුමත කර ගත යුතු වේ.

08. ***බැඳුම්කරය :***
පාඨමාලාවට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නීති රීති අනුව නියමිත කාල පරිච්ඡේදයක් ඔහු/ඇය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට අධ්‍යාපන ලේකම්/පළාත් අධ්‍යාපන ලේකම් සමග ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතු වේ.

09. තෝරාගනු ලැබූ අයදුම්කරුවකු පාලනය කර ගත හැකි හේතූන් මත පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ නොකර නියමිත කාලසීමාව ඇතුළත දී ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට අපොහොසත් වූයේ නම්, එම අධ්‍යයන නිවාඩු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද සම්පූර්ණ වැටුප් හා දීමනා ආපසු ගෙවිය යුතු වේ.

10. පාඨමාලාව හදාරන කාලය තුළ දී ශිෂ්‍යයින්ගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔවුන් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

11. මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

එන්. එච්. එම්. චිත්‍රානන්ද,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2020 ජනවාරි මස 31 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

**2020 වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කිරීම**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

---

| ඉල්ලුම් කරන මාධ්‍යය (සිංහල/දෙමළ) | ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය (කොළඹ/යාපනය) | ඉල්ලුම් කරන විශ්වවිද්‍යාල (කොළඹ/පේරාදෙණිය/රජරට/යාපනය)<br>සැ. යු. :<br>මනාපය අනුපිළිවෙළින් විශ්වවිද්‍යාල දෙක සඳහන් කරන්න. |
|---|---|---|
| | | 1.<br><br>2. |

01. (i) මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (වාසගම ඉදිරියෙන්) :————.
උදා : Mr. SILVA A.B.C.
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) (අ)රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) රාජකාරි දුරකථන අංකය :————.

(ii) (අ) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) පෞද්ගලික දුරකථන අංකය :————.

(iii) සේවය කරන පාසලේ/ ආයතනයේ පිහිටීම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| පළාත | දිස්ත්‍රික්කය | කලාපය |
|---|---|---|
| | | |

(iv) ආයතනයේ ස්වභාවය (රජයේ පාසල්/පෞද්ගලික පාසල්/පිරිවෙන්/වෙනත්) :————.

03. (i) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(ii) 2020.03.20 වැනි දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
(iii) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

04. උපාධිය පිළිබඳ විස්තර :

| උපාධිය | විශ්ව විද්‍යාලයේ පාඨමාලාව හැදෑරූ කාලය (...... සිට ....... දක්වා) | උපාධිය සමත් වූ වර්ෂය | උපාධිය වලංගු දිනය | උපාධි විෂයයන් | සාමාර්ථයේ ස්වභාවය | විශ්ව විද්‍යාලය/ ආයතනය | උපාධිය (අභ්‍යන්තර /බාහිර) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

05. (i) (අ) ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයට/ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයට/ ශ්‍රී ලංකා ගුරු සේවයට පත්වූ දිනය :————.
(ආ) එම සේවයේ වැඩ භාරගත් දිනය :————.
(ඇ) දැනට දරන තනතුර :————.

(ii) (අ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට/ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ දිනය :————.

(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වැඩ භාරගත් දිනය :————.

(iii) උපාධියෙන් පසු 2020.03.20 වැනි දිනට 4v හි සඳහන් අදාළ සේවයේ/ සේවාවල සේවා කාලය :————.

(iv) 2020.03.20 වැනි දිනට 4v හි සඳහන් අදාළ සේවයේ/සේවාවල සම්පූර්ණ සේවා කාලය :————.

06. වෘත්තීය පුහුණුව පිළිබඳ විස්තර :

| පාඨමාලාව හැදෑරූ ආයතනය (ගුරු විද්‍යාලය/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හෝ වෙනත්) | පාඨමාලාව (විෂය ක්ෂේත්‍රය) | ආයතනයේ පාඨමාලාව හැදෑරූ කාලසීමාව | |
|---|---|---|---|
| | | දින සිට | දින දක්වා |
| | | | |

07. ලබාගත් අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර :

| අධ්‍යයන නිවාඩුවේ ස්වභාවය (වැටුප් සහිත/ වැටුප් රහිත, දේශීය/විදේශීය) | අධ්‍යයන නිවාඩු ලබාගත් කාරණය | කවර කාලසීමාවේද යන්න | බැඳුම්කර කාලය (..... දින සිට ....... දින දක්වා) | බැඳුම්කර කාලය සම්පූර්ණ කර ඇති ද/නැති ද යන වග (සම්පූර්ණ නැතිනම් ඒ සඳහා ඉදිරියට ඇති කාලය සඳහන් කරන්න) |
|---|---|---|---|---|
| | | | | |

*සැලකිය යුතු ය* :-

මීට පෙර ලබා ඇති අධ්‍යයන නිවාඩුවලට අදාළව උක්ත වගුව නිවැරදිව සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

*සටහන* : ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ කාලසීමාව අධ්‍යයන නිවාඩුවක් ලෙස නොසැලකේ.

08. (අ) ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පවතී ද? ඔව්/නැත
(ආ) පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු :————.

09.

| | |
|---|---|
| තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවන්න. | කුවිතාන්සි අංකය :————.<br>දිනය :————.<br>තැපැල්/උප තැපැල් කාර්යාලයට රු. :————.<br>(මුදල අකුරෙන්) ගෙවන ලද බවට සහතික කරමි.<br>අයදුම්කරුගේ අත්සන :————.<br>දිනය :————. |

10. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සත්‍ය බවට ද 2020.02.20 වැනි දින ගැසට් නිවේදනයේ 04 වැනි ඡේදය අනුව මා මෙම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බවට ද, විභාග පනතේ අයදුම්කරුවන් සඳහා වූ නීතිරීති වලට එකඟව කටයුතු කරන බවට ද නියමිත විභාග ගාස්තු ගෙවා වලංගු කුවිතාන්සියක් අමුණා ඇති බවට ද මෙයින් සහතික වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. පාඨමාලාව සඳහා ආයතනයෙන් නිදහස් කිරීමේ නිර්දේශය :
(විදුහල්පති, පීඨාධිපති, කෘත්‍යාධිකාරී, පාලක මණ්ඩලයේ කළමනාකරු හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.)

පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමේ අවශ්‍යතාවය සලකා බලා මෙම අයදුම්කරු සේවයෙන් නිදහස් කරමි/නොකරමි.

————.
විදුහල්පතිගේ/ ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

12. පාඨමාලාව සඳහා අයදුම්කරු නිදහස් කිරීම පිළිබඳ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය :

උක්ත නම් සඳහන් අයදුම්කරු පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිල මුද්‍රාව)

දිනය :————.

02-500

---

**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා හෙද සභාවට ඉදිරි වර්ෂ 5ක කාලය සඳහා නව සාමාජිකයන් පත්කර ගැනීමට නාම යෝජනා කැඳවීම

1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත හා 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධිත) පනතේද අංක 2090/18 හා 2018.09.27 දිනැති *අතිවිශේෂ ගැසට්* පත්‍රය මගින් සාදන ලද 2018 අංක 01 දරන ශ්‍රී ලංකා හෙද සභා (සභා සාමාජිකයන්ගේ පශ්චාත් උපාධි සුදුසුකම්) නියෝග ද පරිදි ශ්‍රී ලංකා හෙද සභාවට ඉදිරි වර්ෂ 5ක කාලය සඳහා සාමාජිකයින් තෝරා පත් කර ගැනීමට මෙමගින් නාම යෝජනා කැඳවනු ලැබේ. තවද, 2017.07.21 වන දිනැති *ගැසට්* පත්‍රයෙහි පලකළ ශ්‍රී ලංකා හෙද සභාවට ඉදිරි වර්ෂ 5ක කාලය සඳහා නව සාමාජිකයන් පත්කර ගැනීමට නාම යෝජනා කැඳවීම සඳහා වූ නිවේදනය මෙමගින් අවලංගු කරනු ලැබේ.

01. මේ සමග පළකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව පමණක් පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍රය මගින් නාම යෝජනා ඉදිරිපත් කළ යුතුය.

02. මෙම නිලවරණය සම්බන්ධ කටයුතු මෙහෙයවීම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ගේ සභාපතිත්වයෙන් යුත් ''ශ්‍රී ලංකා හෙද සභාවේ නිලවරණ කමිටුව'' මගින් සිදු කරනු ලැබේ.

03. සියලුම නාම යෝජනා 2020 මාර්තු මස 06 දින පස්වරු 4.00ට පෙර මෙහි පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් ඉදිරිපත් කළයුතුය. නාම යෝජනා ඉල්ලුම් පත බහා එවනු ලබන කවරයේ වම්පස උඩ කෙළවරේ ''ශ්‍රී ලංකා හෙද සභාව සඳහා නාම යෝජනා'' යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා හෙද සභාවේ නිලවරණ කමිටුව,
අතිරේක ලේකම් (සංවර්ධන) අංශය,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය,
සුවසිරිපාය,
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

04. පහත ප්‍රකාරව ලියාපදිංචි වී නොමැති අයදුම්කරුවකු හෝ අසම්පූර්ණ, නියමිත දිනට පසුව ලැබෙන නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. සියලුම නාම යෝජනා පත්‍ර ඒ පිළිබඳව සැළකිල්ලක් දක්වන්නන්ගේ පරීක්ෂණය සඳහා 2020 මාර්තු 11 දින පෙ. ව. 10.00 සිට පස්වරු 3.00 දක්වා සභාපති/ශ්‍රී ලංකා හෙද සභාවේ නිලවරණ කමිටු කාර්යාලයේදී (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, අතිරේක ලේකම් සංවර්ධන අංශය) ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

06. නාම යෝජනා වලට විරෝධතා 2020 මාර්තු 12 දින පෙ. ව. 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා සභාපති/ශ්‍රී ලංකා හෙද සභාවේ නිලවරණ කමිටුව, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. නාම යෝජනා සම්බන්ධ අවසන් තීරණ විරෝධතා වෙතොත් ඒවා ද සලකා බැලීමෙන් අනතුරුව 2020 මාර්තු 12 දින ප.ව. 4.00 ට සභාපති/ශ්‍රී ලංකා හෙද සභාවේ නිලවරණ කමිටු කාර්යාලයේදී (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, අතිරේක ලේකම් සංවර්ධන අංශය) ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

07. ඡන්දය පැවැත්වෙන ස්ථානය, දිනය හා වේලාවන් පසුව නිවේදනය කරනු ඇත.

08. හෙද සභා නිලවරණය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලැබෙනුයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් සඳහන් හෙද/හෙදි නිලධාරීන්ට පමණි. එම නාම ලේඛනය හෙද සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක.

08.1 එම නාමලේඛනය 2020.01.31 දින දක්වා ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි හෙද/හෙදි නිලධාරීන්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි හෙද/හෙදි නිලධාරීන්, සේවයේ නියුතු බවට සහතික කර ආයතනවලින් ලබා දුන් නාම ලේඛනවල සඳහන් ලියාපදිංචි හෙද/හෙදි නිලධාරීන්ගේ නම් ඇතුලත් කර සකස් කර ඇත.

09. ශ්‍රී ලංකා හෙද සභාවේ ඉදිරි වර්ෂ 5ක කාලය සඳහා සාමාජික/සාමාජිකාවන් තෝරාපත් කර ගැනීම පහත ආකාරයට සිදු කරනු ඇත.

09.1 1988 අංක 19 දරන හෙද සභා පනත සහ එම පනතේ 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ II වන උප වගන්තිය සහ අංක 2090/18 දරන 2018.09.27 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රය මගින් සාදන ලද නියෝග අංක 2 (අ) හි විධිවිධාන අනුව හෙද පරිපාලනය පිළිබඳව නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබුවාවූද, හෙද පරිපාලනය පිළිබඳ අවුරුදු 05 පළපුරුද්දක් ඇතුළු අවුරුදු 12කට නොඅඩු කාලයක් හෙද වෘත්තියෙහි පළපුරුද්දක් ඇත්තාවූද සහ ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තාවූද වෘත්තියෙහි යෙදී සිටින්නාවූද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ පළාත් රාජ්‍ය සේවාවේ, හෙද සේවාවේ (රෝහල්) නියුතු නිලධාරීන් අතුරෙන් විශේෂ ශ්‍රේණිය හා I ශ්‍රේණියේ (රෝහල් සේවා) හෙද/හෙදි නිලධාරීන් අතරින් එක් නිලධාරිනියක් හෝ නිලධාරියෙක්.

කෙසේ වුවද, උක්ත ඡේදයේ සඳහන් නියෝග අංක 2 (අ) අනුව නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ඇති කිසිදු තැනැත්තෙකු නාම යෝජනා ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී, අංක 2090/18 දරන 2018.09.27 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රය මගින් සාදන ලද නියෝග අංක 2 (ආ) හි විධිවිධාන අනුව පශ්චාද් ප්‍රාථමික හෙද විදුහල විසින් නිකුත් කරන ලද රෝහල් වාට්ටු කළමණාකරණය හා අධීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා හෙද සභාව විසින් පිළිගත් ඒ හා සමාන වෙනයම් සුදුසුකමක් පශ්චාත් උපාධි සුදුසුකම වෙනුවෙන් ආදේශ කරනු ලැබේ.

09.2 1988 අංක 19 දරන හෙද සභා පනත සහ එම පනතේ 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ III වන උප වගන්තිය සහ අංක 2090/18 දරන 2018.09.27 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් සාදන ලද නියෝග අංක 2(අ) හි විධිවිධාන අනුව නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබුවා වූද අවුරුදු 12කට නොඅඩු කාලයක් හෙද පාසලක ඉගැන්වීමෙහි හෝ පරිපාලනයෙහි පළපුරුද්දක් ඇත්තාවූ සහ ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද අධ්‍යාපන අංශයේ විශේෂ ශ්‍රේණියේ හා I ශ්‍රේණියේ හෙද/හෙදි නිලධාරීන් අතරින්, එක් නිලධාරිනියක් හෝ නිලධාරියෙක්.

කෙසේ වුවද, උක්ත ඡේදයේ සඳහන් නියෝග අංක 2(අ) අනුව නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ඇති කිසිදු තැනැත්තෙකු නාම යෝජනා ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී, අංක 2090/18 දරන 2018.09.27 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රය මගින් සාදන ලද නියෝග අංක 2(ආ) හි විධිවිධාන අනුව පශ්චාද් ප්‍රාථමික හෙද විදුහල විසින් නිකුත් කරන ලද ඉගැන්වීම හා අධීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා හෙද සභාව විසින් පිළිගත් ඒ හා සමාන වෙනයම් සුදුසුකමක් පශ්චාත් උපාධි සුදුසුකම වෙනුවෙන් ආදේශ කරනු ලැබේ.

09.3 1988 අංක 19 දරන හෙද සභා පනත සහ එම පනතේ 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ IV වන උප වගන්තිය සහ අංක 2090/18 දරන 2018.09.27 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රය මගින් සාදන ලද නියෝග අංක 2(අ) හි විධිවිධාන අනුව නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබුවා වූද මහජන සෞඛ්‍ය හෙද කේෂත්‍රයේ අවුරුදු 12කට නොඅඩු කාලයක් පළපුරුද්දක් ඇත්තාවූ, සහ ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තා වුද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා පළාත් රාජ්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය කේෂත්‍රයේ විශේෂ ශ්‍රේණියේ හා I ශ්‍රේණියේ හෙදි නිලධාරිනියක ලෙස වෘත්තියෙහි යෙදී සිටින්නාවූ හෙදි නිලධාරිනීන් අතරින් එක් නිලධාරිනියක්.

කෙසේ වුවද, උක්ත ඡේදයේ සඳහන් නියෝග අංක 2 (අ) අනුව නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ඇති කිසිදු තැනැත්තෙකු නාම යෝජනා ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී, අංක 2090/18 දරන 2018.09.27 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් සාදන ලද නියෝග අංක 2 (ආ) හි විධිවිධාන අනුව පශ්චාද් ප්‍රාථමික හෙද විදුහල විසින් නිකුත් කරන ලද මහජන සෞඛ්‍ය හෙදකම පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා හෙද සභාව විසින් පිළිගත් ඒ හා සමාන වෙනයම් සුදුසුකමක් පශ්චාත් උපාධි සුදුසුකම වෙනුවෙන් ආදේශ කරනු ලැබේ.

09.4 1988 අංක 19 දරන හෙද සභා පනත සහ එම පනතේ 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ V වන උප වගන්තිය සහ අංක 2090/18 දරන 2018.09.27 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රය මගින් සාදන ලද නියෝග අංක 2(අ) හි විධිවිධාන අනුව නියමිත පශ්චාත් උපාධිය සුදුසුකම් ලබා ඇත්තාවූ පළාත් පාලන සේවයේ නියුක්තව සිටින්නාවූද, අවුරුදු 12කට නොඅඩු කාලයක් හෙද වෘත්තියෙහි පළපුරුද්දක් ඇත්තාවූ, සහ ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද හෙද/හෙදි නිලධාරීන් අතරින්, එක් නිලධාරිනියක් හෝ නිලධාරියෙක්.

කෙසේ වුවද, උක්ත ඡේදයේ සඳහන් නියෝග අංක 2 (අ) අනුව නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ඇති කිසිදු තැනැත්තෙකු නාම යෝජනා ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී අංක 2090/18 දරන 2018.09.27 දිනැති *අති විශේෂ ගැසට්* පත්‍රය මගින් සාදන ලද නියෝග අංක 2 (ආ) හි විධිවිධාන අනුව පශ්චාද් ප්‍රාථමික හෙද විදුහල විසින් නිකුත් කරන ලද ඉගැන්වීම හා අධීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ මහජන සෞඛ්‍ය හෙදකම පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ රෝහල් වාට්ටු කළමණාකරණය හා අධීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා හෙද සභාව විසින් පිළිගත් ඒ හා සමාන වෙනයම් සුදුසුකමක් පශ්චාත් උපාධි සුදුසුකම වෙනුවෙන් ආදේශ කරනු ලැබේ.

09.5. 1988 අංක 19 දරන හෙද සභා පනත හා එම පනතේ 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ VII වන උප වගන්තිය අනුව අවම වශයෙන් අවුරුදු 5ක හෙද වෘත්තියෙහි යෙදීමේ පළපුරුද්දක් ඇති සහ ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තාවූද වෘත්තියෙහි යෙදී සිටින්නා වු ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික හෙද/හෙදි නිලධාරීන් අතරින් (III,II,I හා අධි ශ්‍රේණියේ) පස් (05) දෙනෙක්.

09.6 1988 අංක 19 දරන හෙද සභා පනත සහ එම පනතේ 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ XVI වන උපවගන්තිය අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සහ පළාත් සභාවල ආයුර්වේද ආරෝග්‍යශාලාවල සේවය කරන පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තාවු ද, හෙද/හෙදි නිලධාරීන් අතරින් එක් නිලධාරිනියක් හෝ නිලධාරියෙක්.

09.7 1988 අංක 19 දරන හෙද සභා පනත සහ එම පනතේ 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ XVII වන උපවගන්තිය අනුව පෞද්ගලික රෝහල් සේවයේ යෙදී සිටින්නා වූ ද, ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, හෙද/හෙදි නිලධාරීන් අතරින් එක් නිලධාරිනියක් හෝ නිලධාරියෙක්.

10. I. එක් සාමාජිකයෙකු/සාමාජිකාවක පමණක් තෝරා පත්කර ගත යුතු ක්ෂේත්‍රවල හෙද/හෙදි නිලධාරීන්ට අදාල වන ක්ෂේත්‍රයේ එක් අපේක්ෂකයෙකුට පමණක් තම මනාපය ප්‍රකාශ කිරීමේ අවස්ථාව හිමි වනු ඇත.

II. උක්ත 9.5 ඡේදයේ සඳහන් සාමාජිකයන් 05 දෙනෙකු තෝරාපත් කර ගැනීමට අදාල සුදුසුකම්ලත් ඡන්දදායකයෙකුට උපරිම වශයෙන් අපේක්ෂකයන් 05 දෙනෙකුට තම මනාපය ප්‍රකාශ කිරීමේ හිමිකම් ලැබෙනු ඇත.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

ලේකම්,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය.

### සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත සහ 2005 අංක 35 දරන ශ්‍රී ලංකා හෙද සභා (සංශෝධන) පනතේද අංක 2090/18 සහ 2018.09.27 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රය මගින් සාදන ලද 2018 අංක 01 දරන ශ්‍රී ලංකා හෙද සභා (සභා සාමාජිකයන්ගේ පශ්චාත් උපාධි සුදුසුකම්) නියෝග ද ප්‍රකාරව ඉදිරි වර්ෂ 05 සඳහා ශ්‍රී ලංකා හෙද සභාවේ සාමාජිකයෙකු/සාමාජිකාවක් ලෙස පත්වීම සඳහා නාම යෝජනා ඉල්ලුම් පත්‍රය.

පහත සඳහන් විස්තර දක්වා ඇති මා ශ්‍රී ලංකා හෙද සභාවේ සාමාජිකයෙක්/සාමාජිකාවක් ලෙසට තෝරා පත් කර ගැනීමට මාගේ මනාපය මින් පළ කරන අතර ඒ සඳහා වූ මාගේ නාමයෝජනාව මේ සමග ඉදිරිපත් කරමි.

ඉල්ලුම් කරන කාණ්ඩය :

| | | |
|---|---|---|
| 8.1 | රෝහල් සේවා | |
| 8.2 | හෙද අධ්‍යාපන | |
| 8.3 | මහජන සෞඛ්‍යය | |
| 8.4 | පළාත් පාලන | |
| 8.5 | මාණ්ඩලික හෙද/හෙදි නිලධාරින් (III, II, I හා අධිශ්‍රේණිය) | |
| 8.6 | ආයුර්වේද | |
| 8.7 | පෞද්ගලික | |

*සටහන* : කරුණාකර ඉල්ලුම් කරන කාණ්ඩයට අදාල කොටුව තුළ ✓ ලකුණ යොදන්න.

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. මුලකුරු සමග නම :————.
3. උපන් දිනය :————.
4. වර්තමාන රාජකාරි ලිපිනය :————.
5. ස්ථිර ලිපිනය :————.
6. වර්තමාන ශ්‍රේණිය/තනතුර :————.
7. වර්තමාන තනතුරට පත් වූ දිනය :————.
8. හෙදියක/හෙදවරයෙකු ලෙස ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :————.
9. හෙදියක/හෙදවරයෙකු ලෙස වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :————.
10. හෙද සේවයට පළමු පත්වීමේ දිනය :————.
11. පශ්චාද් ප්‍රාථමික හෙද පුහුණුව සමත් වූ දිනය :————.
12. ලබා ඇති පශ්චාත් උපාධි සුදුසුකම :————.
13. පශ්චාත් උපාධි සුදුසුකම ලබාගත් විශ්ව විද්‍යාලය/ආයතනය :————.
14. පශ්චාත් උපාධි සුදුසුකම ලබාගත් දිනය :————.
15. ඉල්ලුම් කරන කාණ්ඩය :————.
16. හෙද පුහුණුවට ඇතුල් වූ දිනය හා හෙද විදුහල :————.
17. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :————.

(ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ හෙදියක ලෙස ලියාපදිංචි සහතිකයේ සහතික කළ ඡායා පිටපතක්/පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ඇත්නම් පශ්චාත් උපාධි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් /පශ්චාද් ප්‍රාථමික හෙද පුහුණුව, වාට්ටු කළමණාකරණය හා අධීක්ෂණය/ඉගැන්වීම හා අධීක්ෂණය/මහජන සෞඛ්‍යය හෙද පුහුණුව, පිළිබඳ ඩිප්ලෝමා සහතිකයෙහි සහතික කරන ලද ඡායා පිටපතක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.)

### යෝජනා ස්ථිරය

ඉහත ........................................................ මහතා/මහත්මිය/මෙනවියගේ ............................. සේවා කාණ්ඩය සඳහා වූ නාමයෝජනා ඉල්ලුම් පත්‍රය මින් යෝජනා කොට ස්ථිර කරමු.

*යෝජනාකරු :*

නම ..............................
ශ්‍රේණිය ..............................
සේවා කාණ්ඩය ..............................
හෙද (රෝහල් සේවා)/හෙද අධ්‍යාපන/ මහජන සෞඛ්‍යය/පළාත් පාලන/මාණ්ඩලික හෙද, හෙදි නිලධාරීන්/ආයුර්වේද/පෞද්ගලික)
තනතුර ..............................
සේවා ස්ථානය ..............................
හෙද සභාවේ ලියාපදිංචි අංකය හා දිනය
..............................
වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
හා දිනය..............................

*ස්ථිරකරු :*

නම ..............................
ශ්‍රේණිය ..............................
සේවා කාණ්ඩය ..............................
හෙද (රෝහල් සේවා)/හෙද අධ්‍යාපන/ මහජන සෞඛ්‍යය/ පළාත් පාලන/මාණ්ඩලික හෙද, හෙදි නිලධාරීන්/ ආයුර්වේද/පෞද්ගලික)
තනතුර ..............................
සේවා ස්ථානය ..............................
හෙද සභාවේ ලියාපදිංචි අංකය හා දිනය
..............................
වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
හා දිනය..............................

............... ...............
දිනය යෝජනාකරුගේ අත්සන

............... ...............
දිනය ස්ථිරකරුගේ අත්සන

(ශ්‍රී ලංකා හෙද සභාවේ/වෛද්‍ය සභාවේ හෙදියන් ලෙස ලියාපදිංචි සහතිකයේ සහතික කළ ඡායා පිටපත ඉදිරිපත් කළ යුතුය.)

ඉහත සඳහන් කර ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මින් සහතික වන අතර, අසත්‍ය හා වැරදි තොරතුරු ඉදිරිපත් කිරීම තුළින් මාගේ නාමයෝජනාව ප්‍රතික්ෂේප වන බවද මා දනිමි.

මෙයට,
විශ්වාසී,
..............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...............

*නිලවරණ කමිටුවේ භාවිතය සඳහා—*
නාම යෝජනා පත්‍රය පිළිගන්නා ලදී/ප්‍රතික්ෂේප කරන ලදී.

හේතු :
........................................................................................
........................................................................................
........................................................................................
........................................................................................

————,
නාම යෝජනා භාර ගැනීමේ නිලධාරි,
සභාපති,
ශ්‍රී ලංකා හෙද සභාවේ නිලවරණ කමිටුව.

දිනය :————.

02-608

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2020**

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2020.03.05 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| දකුණු පළාත | හම්බන්තොට | තිස්සමහාරාමය | පළාත් සර්වේයර් ජනරාල් (දකුණු පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගාල්ල. | තිස්සමහාරාමය අවට | 2020.03.13 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතු ය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩ පහසුකම් ද තිබිය යුතු අතර, නිලධාරීන් දහදෙනෙකුට ප්‍රමාණවත් කාමර පහසුකම් ද තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2020.03.05 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

එස්. ඩී. පී. ජේ. දාම්පෙගම,
සර්වේයර් ජනරාල්,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ 05.

2020 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2020

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2020**

ගොඩනැගිලි අයිතිකරුගේ -

1. සම්පූර්ණ නම : ____________.
2. ලිපිනය : ____________.
3. දුරකථන අංකය : ____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : ____________.

ගොඩනැගිල්ල -

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : ____________.
2. මාසික කුලී මුදල : ____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : ____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ____________.
5. භූමියේ විශාලත්වය : ____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: ____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/..........................) : ____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : ____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් ම විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන.

02-440

---

## බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - අත්තනගල්ල, නිට්ටඹුව**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ හා බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ 2020.04.04 පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වෙන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දින එය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගෙන් නිසි අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලු ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදින ප. ව. 3.00 ට පෙර ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා ගැණුම්කරුවන් විසින් තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසිය අවස්ථාවේ දී අධිකරණය විසින් තබනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී ඉදිරිපත් කළ භාණ්ඩ සම්බන්ධව අවසන් තීරණය ගරු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව දන්වා සිටිමි.

ඒ. එම්. එන්. පී. අමරසිංහ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
අත්තනගල්ල - නිට්ටඹුව.

2020 ජනවාරි මස 30 වැනි දින,
අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ලැයිස්තුව**

| | | |
|---|---|---|
| 01. | AR 2049/15 | N 901930 අංක දරන පා පැදිය |
| 02. | AR 1277/17 | පා පැදියක් |
| 03. | AR 191/19 | 8078 H දරන කොටස් අඩු පා පැදිය |
| 04. | 59672 | 15 A ප්ලග් ටොප් එක හා බැටරි ක්ලිප් 02ක් සමග අඩි 52 ක් දිග වයරය |
| 05. | 61352 | මල්ටි ෂොකට් |
| 06. | 61353 | මල්ටි ෂොකට් |
| 07. | 63750 | ජල කරාමය |
| 08. | 63751 | ජල කරාමය |
| 09. | 63755 | මල්ටි ෂොකට් |
| 10. | 69689 | ජල කරාමය |
| 11. | 69674 | මල්ටි ෂොකට් |
| 12. | 69691 | මල්ටි ෂොකට් |
| 13. | AR 2008/16 | ජංගම දුරකතනය |
| 14. | AR 466/16 | ජංගම දුරකතනය |
| 15. | AR 293/17 | බන්ඩි කියත අත් කියත |
| 16. | AR 2012/17 | පිහියක් |
| 17. | 63488 | ලී ඉරුම් බංකුව |
| 18. | 55716 | රෙදි මැදීමට ගන්නා මේසය<br>රුක් කලාව<br>දිය ඇල්ල සහිත ඔරලෝසුව |
| 19. | 42832 | කිලෝ 12.5 ලිට්රෝ ගෑස් සිලින්ඩරය වට 3 හි ගෑස් ලිප් එකයි |
| 20. | 48625 | කිලෝ 12.5 ලිට්රෝ ගෑස් සිලින්ඩරය වට 3 හි ගෑස් ලිප් එකයි |
| 21. | 55710 | පුටු 2යි |

**බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කරන ලද භාණ්ඩ ලැයිස්තුව**

| | |
|---|---|
| 22. | අල්මාරිය ලී (වීදුරු) |
| 23. | පරිගණක මොනිටර් 02යි |
| 24. | පරිගණක කී බෝඩ් 03යි |
| 25. | පරිගණක (CPU) 03යි |
| 26. | පරිගණක මේසය |
| 27. | බැටරි (වාහන) 01යි |
| 28. | හෙඩ් ෆොන් කැමරා 02යි |

02-387

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - ඇඹිලිපිටිය**

රජ්‍ය සන්තක කරනු ලැබූ, හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජ්‍ය සන්තක කරනු ලැබූ නඩු අංක සහිත, අංක රහිත, මෙතෙක් කිසිවකු හිමිකම් නොකියන ලද භාණ්ඩ 2020.03.14 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර ඇති භාණ්ඩ පිළිබඳ අයිතිවාසිකම් කියන තැනැත්තකු වෙතොත් වෙන්දේසිය පවත්වනු ලබන දිනයට පෙර ලිඛිතව ඒ බව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැක.

අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් ගෙවීම් කළ යුතු අතර, එදින ප. ව. 4.00 ට පෙර එම භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

මුදල් ගෙවීමේ දී හා භාණ්ඩ භාර ගැනීමේ දී භාණ්ඩ මිලදී ගත් පුද්ගලයා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසි දින රාජකාරි අවසන් වීමට පෙර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

මෙම වෙන්දේසිය පිළිබඳ සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරනු ලබන බව දන්වා සිටිනු ලැබේ.

කේ. පී. ආර්. ලක්මිණි විදානගමගේ,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
ඇඹිලිපිටිය.

2020 ජනවාරි මස 29 වැනි දින,
ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *නඩු භාණ්ඩය* |
|---|---|---|
| 1. | 68729/18 | උදලු 01<br>අලවංගු 01<br>කුඩ 02 |
| 2. | 68888/19 | සවල් 01 |
| 3. | 69297/19 | මල්ටි ප්ලග් එකක් සවි කරන ලද දිග අඩි 127 ක් වන 1.47 වර්ගයේ වයර් රෝල් 01<br>ඇම්පියර් 15 වර්ගයේ දිග අඩි 135ක් පමණ වන වයර් රෝල 01<br>අඩි 05 අඟල් 04 දිග අලවංගුව<br>අඩි 04 අඟල් 04 දිග අලවංගුව<br>අඟල් 31 ක් දිග ලී මිට සහිත උදලු 01<br>මිට අඟල් 29ක් දිග කුළු ගෙඩිය<br>ප්ලාස්ටික් තාච්චිය<br>අඟල් 10ක් දිග කල් කඩන කටුව<br>අඟල් 22ක් දිග ගල් කඩන කටුව |
| 4. | 68109/19 | සවල් 01 |
| 5. | 69488/19 | කුඩා අලවංගු 01 |
| 6. | 68150/19 | විදුලි වතුර මෝටර් 01<br>ප්ලග් පොයින්ට් 01 සහිතව වයර් රෝල් 01<br>කුඩා අලවංගු 01<br>මිට සහිත උදලු 01<br>කුළු ගෙඩි 01<br>බෝර කටු 01<br>ගැරුම් වට්ටි 01<br>පොඩි කුඩ 03<br>අඩි 25 පමණ දිග අඟල් 02 ප්ලාස්ටික් හෝස් 01 |
| 7. | 67639/19 | ඇලුමිනියම් කල 01 |
| 8. | 70846/20 | සවල් 01 |
| 9. | 44443/17 | රෝස පාට බේසම |
| 10. | 63429/11 | සවල් 01 |
| 11. | 68034/19 | ගැරුම් වට්ටි 01<br>ප්ලාස්ටික් තාච්චි 01<br>උදලු 01<br>මිටි 01<br>කම්බි කූරු 01 |
| 12. | 29948/15 | කුඩා අලවංගු 02<br>කුළු ගෙඩි 01<br>උදලු 01<br>මිටි 01 |
| 13. | 71147/20 | ගැරුම් වට්ටි 01 |
| 14. | 68044/19 | උදලු 01<br>තාච්චි 01<br>ගැරුම් වට්ටි 01 |
| 15. | 69935/19 | අලවංගු 02<br>උදලු 01<br>තාච්චි 02 |
| 16. | 67023/19 | Camry වර්ගයේ තරාදි 01<br>නිල්පාට ප්ලාස්ටික් බාල්දි 01 |
| 17. | 69618/19 | පාපැදි 02 |
| 18. | 38370/16 | ලුමාලා වර්ගයේ පාපැදි 01 |
| 19. | 9533/14 | උදලු 01<br>කුඩා අලවංගු 01<br>ගැරුම් වට්ටි 01<br>පොඩි කුඩ 02<br>කැට කුඩ 01<br>බාල්දි 01 |
| 20. | 68133/19 | උදලු 01 |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|
| 21. | 31930/15 | ගැරුම් වට්ටි 01 |
| | | ප්ලාස්ටික් තාච්චි 01 |
| | | උදලු 01 |
| | | කුඩා අලවංගු 01 |
| 22. | 71160/20 | ගැරුම් වට්ටි 01 |
| | | වතුරු එන්ජින් 01 |
| | | අඩි 22 දිග අඟලේ ෆුඩ් වැලය සහිත බටය |
| | | වේවැල් කූඩ 01 |
| | | අඩි 02 දිග හෝස් බට කැබැල්ලක් |
| 23. | 68045/19 | උදලු 01 |
| | | කූඩ 01 |
| | | ගැරුම් වට්ටි 01 |
| 24. | 68440/12 | තරාදි 01 |
| 25. | 68434/12 | තරාදි 01 |
| 26. | 68432/12 | තරාදි 01 |
| 27. | 69759/19 | මුට්ටි 01 |
| 28. | 69757/19 | උදලු 01 |
| 29. | 69168/19 | සවල් 01 |
| 30. | 69295/19 | කුඩා අලවංගු 01 |
| | | ගැරුම් වට්ටි 02 |
| | | උදලු 01 |
| 31. | 70643/19 | කුඩා අලවංගු 01 |
| | | උදලු 01 |
| | | ප්ලාස්ටික් තාච්චි 01 |
| 32. | 70642/19 | වේවැල් කූඩ 01 |
| | | පනිට්ටු 01 |
